**ආගමනය හා විගමනය සහ පුරවැසිභාවය**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

(අ) පුරවැසිභාවය, පුරවැසිභාවයට ඇතුළත් කිරීම සහ විදේශිකයෝ ;

(ආ) උදර්පණය ; සහ

(ඇ) ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩදීම සහ විගමනය හා ශ්‍රී ලංකාවෙන් පිටමං කිරීම; විදේශ ගමන් බලපත්‍ර හා වීසා බලපත්‍ර.

**ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා සඳහා ඡන්ද විමසීම සහ පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම ඇතුළුව, ඡන්ද විමසීම**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

පාර්ලිමේන්තුව සඳහා, පළාත් සභා සඳහා, පළාත් පාලන ආයතන සඳහා සහ ජනාධිපති ධුරය සඳහා ඡන්ද විමසීම; මැතිවරණ දෙපාර්තමේන්තුව.

**ජනලේඛන සහ සංඛ්‍යාලේඛන**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

(අ) ජනලේඛන ; සහ

(ආ) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක කාර්යය සඳහා වූ විමර්ශන, සමීක්ෂණ සහ සංඛ්‍යාලේඛන.

**වෘත්තීය රැකියා සහ පුහුණු කිරීම**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

(අ) ජාතික වැදගත්කමින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද විශ්වවිද්‍යාල වැනි ආයතන ;

(ආ) ජාතික වැදගත්කමකින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද විද්‍යාත්මක හෝ කාර්මික අධ්‍යාපනය සඳහා වන ආයතන ;

(ඇ) (i) පොලිස් නිලධරයන් පුහුණු කිරීම ද ඇතුළුව වෘත්තීය, ශිල්පීය හෝ කාර්මික පුහුණුව ; හෝ

(ii) විශේෂ අධ්‍යයන හෝ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ; හෝ

(iii) අපරාධ විමර්ශනය කිරීම හෝ අනාවරණය කර ගැනීම සඳහා විද්‍යාත්මක හෝ කාර්මික සහාය ;

සඳහා වන පළාත් නියෝජ්‍යායතන හා ආයතන ; සහ

(ඈ) උසස් අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා වන ආයතනවල සහ විද්‍යාත්මක හා කාර්මික ආයතනවල සම්බන්ධීකරණය සහ ප්‍රමිති නිශ්චය කිරීම.

**ජාතික ලේඛනාගාරය ; ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යා කටයුතු සහ භූමි හා පුරා වස්තු**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද පෞරාණික සහ ඓතිහාසික ස්මාරක හා වාර්තා සහ පුරා විද්‍යාත්මක භූමි සහ නෂ්ටාවශේෂ.

**පහත දැක්වෙන විෂයයන් ඇතුළුව I වන ලැයිස්තුවේ හෝ III වන ලැයිස්තුවේ නිශ්චය කොට දක්වා නොමැති සියලු විෂයයන් හා කර්තව්‍ය :**

(අ) ශ්‍රී ලංකාවෙන් බැහැර ස්ථානවලට වන්දනා ගමන් ;

(ආ) බැංකු, රක්ෂණ සහ මූල්‍ය සංස්ථා ඇතුළුව එහෙත් සමුපකාර සමිති අත්හැර : වෙළෙඳ සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම හා ගණන් බේරා වසා දැමීම;

(ඇ) එක් පළාතකට සීමා නොවූ අරමුණු ඇති එහෙත් විශ්වවිද්‍යාල ඇතුළත් නොවන වෙළෙඳ හෝ වෙළෙඳ නොවන සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම හා ගණන් බේරා වසා දැමීම ;

(ඈ) පේටන්ට් බලපත්‍ර, නව නිර්මාණ සහ මෝස්තර, ප්‍රකාශන අයිතිය, වෙළෙඳ ලකුණු සහ වෙළෙඳ බඩු ලකුණු ;

(ඉ) කිරුම් හා මිනුම් පිළිබඳ ප්‍රමිති නියම කිරීම ;

(ඊ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන හෝ එක් පළාතකින් තව පළාතකට ප්‍රවාහනය කරන භාණ්ඩ සඳහා ප්‍රමිති නියම කිරීම ;

(උ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පාලනය කිරීම ජාතියේ හිත පිණිස අවශ්‍යවේ යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද කර්මාන්ත ;

(ඌ) පතල්වල ශ්‍රමය සහ කම්කරුවන්ගේ ආරක්ෂාකාරිත්වය විධිමත් කිරීම;

(එ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජ්‍යායතන විසින් ලුණු නිෂ්පාදනය කිරීම, සැපයීම හා බෙදාහැරීම; වෙනත් නියෝජ්‍යායතන විසින් කරන ලුණු නිෂ්පාදනය සැපයීම හා බෙදහැරීම විධිමත් කිරීම ;

(ඒ) අපනයනය සඳහා අබිං වගා කිරීම, නිෂ්පාදනය කිරීම සහ විකිණීම ;

(ඔ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සේවා නියුක්තයන් හා සම්බන්ධව කාර්මික ආරාවුල් ;

(ඕ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මුදල් සපයන ලද්දා වූ ද ජාතික වැදගත්කමකින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද කෞතුකාගාර සහ යුද්ධ ස්මාරක වැනි ආයතන ;

(ක) ශ්‍රී ලංකාව මැනීම ; ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක, උද්භිද විද්‍යාත්මක, සත්ව විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක සමීක්ෂණ ; කාලගුණ විද්‍යා සංවිධාන ;

(ග) ජාතික රාජ්‍ය සේවා; ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව ;

(ච) විශ්‍රාම වැටුප්, එනම්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙවිය යුතු හෝ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ;

(ජ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ පාර්ලිමේන්තුවේ කථානායකවරයාගේ සහ නියෝජ්‍ය කථානායකවරයාගේ වේතන ;

(ට) පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ කාරක සභාවල බලතල වරප්‍රසාද හා පරිහාර, සාක්ෂි දීම හෝ ලියවිලි ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු කාරක සභා හෝ පාර්ලිමේන්තුව විසින් පත් කරන ලද කොමිෂන් සභා ඉදිරියෙහි පෙනී සිටින ලෙස තැනැත්තන්ට බලකිරීම ;

(ඩ) ජනාධිපතිවරයාගේ සහ ආණ්ඩුකාරවරයන්ගේ පඩිනඩි, දීමනා , වරප්‍රසාද සහ නිවාඩු පිට බැහැරව සිටීමේ අයිතිවාසිකම්; ශ්‍රී ලංකා ආණ්ඩුවේ අමාත්‍යවරයන්ගේ වේතන හා දීමනා ; විගණකාධිපතිවරයාගේ වේතන, දීමනා සහ නිවාඩු හා සම්බන්ධ අයිතිවාසිකම් සහ වෙනත් සේවා කොන්දේසි ;

(ණ) අන්තර් පළාත් සංක්‍රමණය ; අන්තර් පළාත් නිරෝධායනය ;

(ත) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක් හා සම්බන්ධ නීතිවලට විරුද්ධව සිදු කරනු ලබන වැරදි ; සහ

(ද) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක් හා සම්බන්ධ ගාස්තු, එහෙත් යම් අධිකරණයක දී ගනු ලබන ගාස්තු බැහැර කොට.